ලංසු සඳහා ආරාධනයයි

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අභිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

ගර්කින් (Gherkin) වගා ව්‍යාපෘතිය සඳහා බිංදු ජල සම්පාදන පද්ධති සැපයීම, බෙදා හැරීම සහ ස්ථාපනය කිරීම.

ලංසු අංකය: SARP/G/NCB/Gherkin/2026/983

1. ශ්‍රී ලංකාව වෙත ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අරමුදලෙන් (IFAD) ණය මුදලක් ලබාගෙන ඇති අතර, එම ණය ලැබීම්වලින් කොටසක් SARP ව්‍යාපෘතිය යටතේ අනුරාධපුරය වව්නියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා ගර්කින් වගාව සඳහා බිංදු වාරිමාර්ග පද්ධති, සැපයීම, බෙදාහැරීම සහ ස්ථාපනය කිරීම සඳහා යෙදවීමට අදහස් කරයි.

2. SARP ව්‍යාපෘතිය, ගර්කින් වගා ව්‍යාපෘතියට අවශ්‍ය වන, 'ලේසර් පන්ච්' (laser punch) බිංදු ජල සම්පාදන පද්ධති සැපයීම, බෙදා හැරීම සහ ස්ථාපනය කිරීම වෙනුවෙන් සඳහා සුදුසුකම් ලත් සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. කාණ්ඩ අංකය, අයිතම නාමය, අවශ්‍ය ප්‍රමාණයන් සහ අනුරූප ලංසු සුරක්ෂණයේ වටිනාකම ආදී තොරතුරු පහත වගුවේ දැක්වේ..

කාණ්ඩ අංකය	අයිතම විස්තරය	ප්‍රමාණය	ලංසු සුරක්ෂණයේ වටිනාකම (රුපියල්)
A	ගර්කින් වගාව සඳහා 'ලේසර් පන්ච්' බිංදු ජල සම්පාදන පද්ධති (Laser punch drip irrigation systems) සැපයීම, බෙදාහැරීම හා ස්තාපනය කිරීම	250	250,000.00
B	ගර්කින් වගාව සඳහා 'ලේසර් පන්ච්' බිංදු ජල සම්පාදන පද්ධති (Laser punch drip irrigation systems) සැපයීම, බෙදාහැරීම හා ස්තාපනය කිරීම.	250	250,000.00

3. ඉහත සඳහන් කළ පරිදි, කැබලි අක්ෂර අනුව, ලංසු කරුවන්ට එක් කාණ්ඩයකට හෝ කිහිපයකට ලංසු ඉදිරිපත් කළ හැකියාව ඇත. ලංසු ඇගයීමට ලක් කරනු ලබන්නේ කාණ්ඩ අංක පදනම මත ය. කෙසේ වෙතත්, තනි ලංසු කරුවෙකුට ප්‍රදානය කළ හැකි උපරිම ප්‍රමාණය පද්ධති 250 කට සීමා වේ.

4. ප්‍රතිචාර දැක්වීමට සහ ලංසු ලේඛනයේ දක්වා ඇති සීමාවන්ට අනුගතවීමට කැමති සියළුම යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් සඳහා මෙම ලංසු ආරාධනාව විවෘත වේ. තවද මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට

වැඩිදුර තොරතුරු SARP ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක. කාර්යාල වේලාව තුළදී, පහත දැක්වෙන ලිපිනයැති ස්ථානයේදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේදී ගාස්තු ගෙවීමකින්තොරව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

5. ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය (NCB) යටතේ **ලංසු** මෙහෙයවන/කැඳවන අතර www.ifad.org/project-procurement වෙබ් අඩවියෙහි ලබා දී ඇති IFAD ප්‍රසම්පාදන අත්පොතට අනුකූලව මෙම ලංසු ලිපිලේඛනයන්හි ඇගයීමේ පටිපාටිය විස්තරකොට ඇත. NCB ක්‍රියාවලියෙහි විස්තර කොට ඇති පරිදි කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර නිර්දේශයන් පරීක්ෂා කර බැලීම, සුදුසුකම් හා පෙර කාර්යසාධන සමාලෝචනය සහ සත්‍යාපනය කිරීම ඇතුළත් වේ.

6. ලංසු ඉදිරිපත් කිරීමට කැමති ලංසු කරුවන් රු. 12,500/= ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා ලංසු ලේඛනය මිල දී ගත යුතු ය.

7. පහත දැක්වෙන ලිපිනයට, ලංසුකරුගේ සම්පූර්ණ තොරතුරු සහිතව විද්‍යුත් ලිපියක් හෝ ලිපියක් එවීමෙන්ද ලංසු ලිපි ලේඛන ලබා ගත හැක. ලංසු ලේඛන ලබා ගැනීම සඳහා මුදල්ගෙවීම, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අභිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP) අයත්වන **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7040662, වෙත කෙරෙන බැංකු ගණුදෙනුවක් මගින් සිදු කළ හැකි අතර SARP ව්‍යාපෘතිය වෙත පැමිණිමෙන්ද එහි ගණකාධිකරී අංශය වෙත මුදල් ගෙවිය හැකියාව ඇත.**

8. ලංසු දත්ත පත්‍රිකාවෙහි , ලංසුකරුවන්ට උපදෙස් 23.1 හි නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ එහි සඳහන් කර ඇති ලිපිනයට 2026 නොවැම්බර් මස 20 දින පෙ.ව. 11.00 ට පෙර ලංසු ගෙනවිත් භාරදිය යුතු අතර , ලංසු භාරදී අවසන් වූ සැණින්ම ලංසුකරුවන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. ඉලෙක්ට්‍රෝනික් ලංසු පිළිනොගන්නා බව කාරුණාවෙන් සැළකිය යුතුය

9. කිසිදු තත්වයක් යටතේ ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා බවත්, එවැනි ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු හරවා එවන බවත්, ඒවායෙහි පිරිවැය ලංසුකරු විසින්ම දැරිය යුතු බවත් සියළුම ලංසුකරුවන් දැනගත යුතුය. තවද සියළුම ලංසු සමග ඉහත වගුවේ දක්වා ඇති පරිදි ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

10. ලිපිනය

ව්‍යාපෘති අධ්‍යක්ෂ
කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අභිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)
නොම්මර 759/2, **මයුරපාද පිරිවෙන පාර, තලංගම - දකුණ,**
පැලවත්ත, **බත්තරමුල්ල.**
දුරකථන: 011 2770998 විද්‍යුත් තැපෑල: procurementsarp@gmail.com